වසර 1996 දී ජොයිස් කැරල් ඕට්ස් ලේඛිකාව තවත් විශේෂ නවකතාවක් ලියා පළ කළාය. එයට පදනම් වී ඇත්තේ ලිගිල් වී යන ඇමෙරිකානු පවුල පිළිබඳ ප්‍රබල අදහසකි. මෙම නිර්මාණය ඇමෙරිකානු පාඨකයන් අතර බෙහෙවින් ජනප්‍රිය වූවකි. ඉන් අනතුරුව ජොයිස්, අන්වර්ථ නාමවලින් කෘති රචනා, කොට ප්‍රකාශයට පත් කරන්නට යොමු වූවාය. 'රොසමන්ඩ් ස්මිත්' සහ 'ලෝරන් කෙලී' එම අන්වර්ථ නාම විය.

මෙම ලේඛිකාව තරමටම හෝ විටෙක ඊටත් වඩා ප්‍රසිද්ධියට පත් වූ ටෝනි මොරිසන් අතින් ලියවුණ කෘති රැසකි. වසර 1931 පෙබරවාරි මස 18 දා උපත ලද මෙම කතුවරිය වඩාත් ප්‍රකටව ඇත්තේ නවකතා කතුවරියක් ලෙසත් ඒ සමගම මහාචාර්යවරියක් ලෙසත්ය. ඇමෙරිකාවේ සුප්‍රකට විශ්වවිද්‍යාලයක් වන 'ප්‍රින්ස්ටන්' විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරියක ලෙස සේවය කරන අතරතුරදී ඇය ලේඛන කලාවට මහඟු සේවයක් ඉටු කළේ විවිධ කෘති රැසක් බිහි කරමිනි. 'ද බ්ලූවස්ට් අයි', 'සූලා', 'සෝං ඔෆ් සොලමන්' සහ 'බිලවඩ්' එම කෘතීන් අතර වඩාත් ප්‍රසිද්ධියක් උසුලයි. උපතින් කළු ජාතික ගැහැනියක වන ඇය සිය වර්ගයා මුහුණ පෑ දුෂ්කරතා හා අසාධාරණකම් ගැන ප්‍රබල අවධානයක් යොමු කළාය. ඇය මුලින් නිර්මාණය කළ කෙටිකතාවකට තේමාව වූයේ ගිල් පැහැති ඇස් ලැබීමට ආශා කළ කළු ජාතික තරුණියක් තුළ වූ ශෝකයයි. අනතුරුව මෙම කතුවරිය එකී කෙටිකතාව වර්ධනය කොට නවකතාවක් ලෙස ප්‍රකාශයට පත් කළාය. එය නම් කරනු ලැබුවේ 'ද බ්ලූවස්ට් අයි' නමිනි.

ටෝනි මොරිසන් ලේඛිකාව විසින් රචිත දෙවන නවකතාව, ලෙස සැලකෙන 'සූලා', 'නැෂනල් බුක් අවෝඩ්' නමැති සම්මානය සඳහා නිර්දේශ විය. තුන් වෙනුව ඇය අතින් නිර්මාණය වී ප්‍රකාශයට පත් වුණ 'සෝං ඔෆ් සොලමන්' නවකතාව ඇයට ජාතික වශයෙන් ගෞරවයක් හා ප්‍රසාදයක් හිමි කර දුන් කෘතියකි. කළු ජාතික ලේඛකයකු හෝ ලේඛිකාවක අතින් ලියවී 'ද බුක් ඔෆ් ද මන්ත්' සමාගමේ ඇගයීමට ලක් වූ ප්‍රථම නවකතාව ලෙස ද මෙය හැඳින්වෙයි.

මොරිසන් තම නවකතා රචනායේදී විශේෂ අවධානයට ලක් කොට ගෙන ඇත්තේ කළු ජාතික ගැහැනියයි. එසේ වුවද කාන්තා විමුක්තියට හෝ කාන්තා අයිතිවාසිකම් දිනා ගැනීමට හෝ අන්තවාදී ගමනක යෙදුණ ගැහැනුන්ගේ ගණයට හෝ එවැන්නන් අතින් ලියවුණ නවකතා ගණයට හෝ තමන් හා තම නිර්මාණ ඇතුළත් කිරීමට ඇය අකමැති වන්නීය. ඇයගේ 'බිලවඩ්' නවකතාව කොතරම් ඇගයීමට ලක් වූයේද යන්නට සාක්ෂි ලෙස ඒ වෙනුවෙන් ඇය හිමි කරගත් 'පුලිට්සර්' ත්‍යාගය හා 'ඇමෙරිකන් බුක් අවෝඩ්' නම් වූ ප්‍රකට සම්මානය ද දැක්විය හැකිය. මේ සියල්ලටත් වඩා මෙම කතුවරිය වසර 1993 දී දිනාගත් 'නොබෙල්' ත්‍යාගය, අනතුරුව 2012 වසරේ මැයි 29 වන දා හිමි කරගත් 'ප්‍රසිඩන්ෂියල් මෙඩල් ඔෆ් ෆ්‍රීඩම්' යන පදනාගත් ඇමෙරිකානු කළු ජාතික කතුවරියක ලෙස ඇය ඉතිහාසගත වීමට හේතු වනු ඇත.

විදෙස් රටවලින් බිහි වූ බොහෝ ලේඛිකාවන් වැඩි වශයෙන්ම නිර්මාණකරණයටම යොමු වූ කාන්තාවන් වූ අතර ඉඳහිට හෝ ඇතැම් ලේඛිකාවන් වෙනත් වෘත්තීයක නිරතව සිට හෝ තවදුරටත් නිරත වෙමින් හෝ ලේඛන කලාවට ද යොමු වී ඇති බව පෙනේ. එවන් විරල ගණයේ කතුවරියක් ලෙස ඉන්දියානු ජාතික 'ශෝභා ඩේ' ලේඛිකාව හඳුන්වා දිය හැකිය. මුලින්ම මෝස්තර ශිල්පිනියක් වීමට රුචියක් දැක්වූ ඇය එහිලා ප්‍රකට කළ සාර්ථකත්වය ද සැලකිය යුතු තරම් විය. පළමුව මෝස්තර ශිල්පිණියක ලෙසත් ඉන් අනතුරුව පුවත්පත් කලා වේදිනියක් ලෙසත් හඳුනාගනු ලැබ සිටි 'ශෝභා ඩේ' ලියූ ප්‍රථම නවකතාව වන්නේ 'ස්ට්‍රින්ජ් ඔබ්සෙෂන්' යන්නය. ඇයගේ මෙම නවකතාවෙහි දැකගත හැකි එක් විශේෂත්වයක් නම් තම සෞන්දර්යාත්මක භාෂා විලාසය යොදාගනිමින් ලිංගිකත්වය පිළිබඳ විවරණයක යෙදීමයි. මේ වන විට නවකතා දාහතක් ලියා ප්‍රකාශයට පත් කර ඇති මෙම කතුවරිය තම නිර්මාණ සඳහා යොදාගෙන ඇත්තේ එකකට එකක් දෙවෙනි නොවන අන්දමේ නවතාවෙන් යුතු සිද්ධි ලෙස හඳුනාගත හැකිය.

'ශෝභා ඩේ' නිර්මාණ ශිල්පිණිය හා කතුවරියගේ නමෙහි තවත් කොටසක් ලෙස 'රාජධ්‍යක්ෂ' යන්න යෙදෙයි. ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේදී, 1948 වසරේ ජනවාරි 7 වන දා උපත ලත් ඇය කුඩා කල හැඳි වැඩුණේ මුම්බායිහිය. උපතින් බ්‍රාහ්මණ පවුලකට අයත් වූ කාන්තාවක් වන ශෝභා ඉගෙනීමේදී පෑ දක්ෂතා සමග දර්ශනවාදය පිළිබඳ උපාධියක් ලබාගැනීමට සමත් වූවාය. ඉහත දැක්වූ පරිදි, පළමුව නිරූපණ ශිල්පිණියක ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹූ ශෝභා 1970 වසරේදී තම ගමන් මග වෙනත් කොට පුවත්පත් කලා වේදියට යොමු වූවාය. ඇයගේ පුවත්පත් කලා දිවියේ එක් වැදගත් අවස්ථාවක් ලෙස හැඳින්විය හැක්කේ 'ද ටයිම්ස් ඔෆ් ඉන්ඩියා' පුවත්පතට ලියූ තීරු ලිපියකි. 'පොලිටිකලි ඉන්කරෙක්ට්' නම් මාතෘකාවෙන් ඇය පළ කළ එම ලිපිය මගින් ඇය විවිධ සමාජීය දේශපාලන හා ආර්ථික කරුණු විවේචනයට ලක් කර ඇත. ඉන්දියානු යොවුන් පරපුර අතර වඩාත්ම ජනප්‍රිය ලේඛිකාව වීමට ද ඇය සමත් වූවාය. සමාජය තුළ වූ විවිධ අඩුපාඩු ගැන අවධානය යොමු කොට ඒවා පිළිබඳව විමර්ශනාත්මකව මෙන්ම කලාත්මකව ද කථා කරන්නට ඇය සිය නවකතා උපයෝගී කරගෙන ඇත. තවමත් ඉන්දියානු තරුණ පරපුරේ ජනප්‍රිය ලේඛිකාවක් ලෙස කැපී පෙනෙන ශෝභා ඩේ ඊට අමතරව 'පෙන්ගුවින්' පොත් ප්‍රකාශන සමාගමේ සංස්කාරකවරියක ලෙස ද සේවය කරන්නීය. මෙම ලේඛිකාවට අමතරව ඉන්දියානු සාහිත්‍යයෙන් අපට හමුවන ප්‍රකට ලේඛිකාවක් ලෙස අරුන්ඳතී රෝයි හඳුන්වා දිය හැකිය. 'සුසෑන් අරුන්ඳතී රෝයි' යනුවෙන් නම් ලත් ඇය 1961 නොවැම්බර් 24 දා උපත ලැබුවාය. 1998 වසරේදී ඇය ප්‍රබන්ධ සඳහා පිරිනැමෙන බුකර් සම්මානයට පාත්‍ර වූවාය. ඒ සඳහා තෝරාගනු ලැබූ, 'ද ගෝඩ් ඔෆ් ස්මෝල් තිංග්ස්'. අද පවා ලොව ප්‍රකට කෘතියකි. මානව හිමිකම් සම්බන්ධයෙන් ද හඬක් නැගූ මෙම කතුවරිය ඉන්දියානු ලේඛිකාවන් අතර ප්‍රධානත්වයක් උසුලන්නීය.

මෙකී ලේඛිකාවන් හැරුණ විට විදේශීය සාහිත්‍යය පුරාම මතු වී පෙනෙන තවත් ලේඛිකාවෝ රැසක්ම වෙති. ඉන්දියාව, ඇමෙරිකාව, කැනඩාව, එංගලන්තය වැනි රටවලින් පමණක් නොව ඕස්ට්‍රේලියාවෙන් ද එවන් ප්‍රකට ලේඛිකාවෝ අපට හමු වෙති. ඔවුන් අතර 'පෙරල්ඩීන් බ්‍රක්ස්', එක් ලේඛිකාවකි. 1955 සැප්තැම්බර් 14 දා උපත ලත් ඇය මුලින්ම ඕස්ට්‍රේලියානු පුවත්පත් කලා වේදිනියක ලෙස ප්‍රසිද්ධියට පත් වූවාය. 2005 වසරේදී මෙම කතුවරියට සුප්‍රසිද්ධ 'පුලිට්සර්' ත්‍යාගය දිනාගත හැකි වූයේ 'මාව්' යන නමින් පළ වූ නවකතාව සඳහාය. මෙය පාඨක ප්‍රතිචාර නොඅඩුව ලබාගත් කෘතියකි. ඕස්ට්‍රේලියානු පුරවැසි භාවය ද සමග ඇය වසර 2002 දී ඇමෙරිකානු පුරවැසිභාවය ද ලබා ගත්තාය. 1944 දී මෙම ලේඛිකාව 'නයින් පාට්ස් ඔෆ් ඩිසයර්' නමින් තම ප්‍රථම නවකතාව ප්‍රකාශයට පත් කිරීමට සමත් වූවාය. ඇය මැද පෙරදිග විසූ කාලය තුළදී එහි ජීවත් වූ මුස්ලිම් කාන්තාවන් අසුරෙන් ලද අත්දැකීම් උක්ත නවකතාවට පාදක කරගෙන ඇත. මෙම ග්‍රන්ථය ජාත්‍යන්තර වශයෙන් වඩාත් අලෙවි වූ කෘතියක් වූ අතර අනතුරුව වෙනත් භාෂා දාහතකට පරිවර්තනය වීමට තරම් පාඨක අවධානයට ලක් වූවක් ද විය. ඇය රචනා කොට පළ කළ වෙනත් නවකතා අතර 'ඉයර් ඔෆ් වන්ඩර්ස්', 'පීපල් ඔෆ් ද බුක්', 'සෙලිබ්‍රිස් ග්‍රොසිං' නම් කෘති ද වෙයි. ඇයගේ මේ සියලු නිර්මාණ කාර්යයන් බෙහෙවින් ඇගයීමට ලක් වූ බවට සාක්ෂි ලෙස, 2006 වසරේදී ඇය 'මාව්' නවකතාව සඳහා හිමිකරගත් 'පුලිට්සර් ත්‍යාගය', 2008 දී 'පීපල් ඔෆ් ද බුක්' කෘතිය සඳහා ඕස්ට්‍රේලියානු ප්‍රකාශකයන්ගේ සංගමයෙන් හිමි වූ ත්‍යාගය ද, හැරුණ විට 2009 සහ 2010 වසරවලදී දිනාගත් ත්‍යාග ද දැක්විය හැකිය.

ලෝකයේ විවිධ රටවල සාහිත්‍ය කරණයෙහි නිරත වූවන් ගැන විමසීමේදී එදා මෙදාතුර ලේඛකයන් මෙන්ම, අඩු සංඛ්‍යාවකින් හෝ ලේඛිකාවන් ද ඊට දායකත්වය සපයා ඇති බව පැහැදිලිය. ශ්‍රී ලාංකික සිංහල සාහිත්‍යය ගැන විමසීමේදී ද ඉහත දැක්වූ කිවිඳියන් හැරුණ විට විශේෂයෙන්ම සිංහල නවකතාව පෝෂණය කළ සුමිත්‍රා රාහුබද්ධ, කැත්ලීන් ජයවර්ධන, පියසීලි විජේමාන්න, සුගන්ත්‍රා රාජකරුණානායක ආදීන් ප්‍රමුඛ ලේඛිකාවෝ කිහිප දෙනෙක්ම වෙති. කවිය කෙරෙහි වැඩි දායකත්වයක් සැපයූ ලේඛිකාවන් ගැන සිහි කරන විට විපුලි නිරෝෂිණී හෙට්ටිආරච්චි පාඨක මතකයට නැගෙනු ඇත. බාල වියේ සිට කවි රචනයට දක්ෂතා පෙන්වන කවිකාචාරිණී දිළිඳි ආරියවංශ වැනි අංකුර කිවිඳියන් ද මතු අනාගතයේ සිංහල සාහිත්‍යය බැබළවීමට පෙරට එනු ඇතැයි සිතිය හැකිය.

IMMIGRATION LAW @
Australian Immigration Law firm
of the Sri Lankan Community

We are proud to have lead the way
for others to follow...

Professional Immigration
Legal Services
Legal Advice in simple to complex
Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced
Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...